ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date | 2014.12.24 |
|---|---|---|---|

ජනාධිපති ලේකම්තුමා,

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරු,

ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්/පොලිස්පති/අධ්‍යක්ෂ - සිවිල් ආරක්ෂක බලකාය,

## 2015 ජනාධිපතිවරණයේදී
## රාජ්‍ය නිලධාරීන්ගේ (යුධ හමුදා.නාවික හමුදා. ගුවන් හමුදා, පොලිස් සහ සිවිල් ආරක්ෂක බලකායද ඇතුළත්ව) සහ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ක්‍රියාත්මකවීම පිළිබඳ නියමයන්

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 170 ව්‍යාවස්ථාව අනුව ජනරජයෙන් වැටුප් ලබන නිලධාරීන් රාජ්‍ය නිලධාරීන් ලෙස අර්ථකථනය කර ඇත. එය දණ්ඩ නීති සංග්‍රහයේ 19 වන වගන්තිය තුළින් ද වැඩිදුරටත් පැහැදිලි කෙරේ. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 4 වන ව්‍යාවස්ථාව ප්‍රකාර සියලුම රාජ්‍ය නිලධාරීන් මානව හිමිකම් වලට ගරු කිරීමට හා ආරක්ෂා කිරීමට බැඳී සිටී. එසේම ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 6 වන සංශෝධනය අනුව ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථවට අනුකූලව කටයුතු කරන බවට සියලුම රාජ්‍ය නිලධාරීන් දිව්රුම් දි ඇත. ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 12 වන ව්‍යාවස්ථාව අනුව සියලුදෙනාම නීතිය ඉදිරියේ සමාන වන අතර නීතිය ක්‍රියාත්මකවීම හා නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතු ය.

ඡන්දය ද මූලික අයිතිවාසිකමක් ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ද තහවුරු කර ඇත. මේ අනුව ඡන්ද විමසුමක් පවත්වන අවස්ථාවක පවත්නා මැතිවරණය නීතිරීති, රටේ පවතින අනෙකුත් නීති හා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවට අනුව ක්‍රියාත්මක වීමට සියලුදෙනා බැඳී සිටින අතර, ඒ ඒ වගකීම් දරණ රාජ්‍ය නිලධාරීන් විසින් එකී නීතිවලට අනුකූලව සාධාරණ හා අපක්ෂපාතිව තම රාජකාරි කටයුතු ක්‍රියාත්මක කළ යුතුව ඇත.

රාජ්‍ය නිලධාරීන් බැඳී සිටින නීතිමය වගකීමක් අයුතු ලෙස යොදාගැනීම හෝ නීතිමය සීමාව ඉක්මවා ක්‍රියාකිරීම මෙන්ම කළ යුතු කාර්යයන් නොකර සිටීම ද පැහැර හැරීම ද අනවශ්‍ය ලෙස ප්‍රමාද කිරීම ද ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව ප්‍රකාරව මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් වේ. ඒ අනුව රාජ්‍ය නිලධාරීන් විසින් එවැනි මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කළ අවස්ථාවලදී ඔවුන්ට විරුද්ධව විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීමට සහ ඔවුන් සම්බන්ධව කටයුතු කිරීමට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත බලතල හිමි වේ.


| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 165, කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08. | | |
| සභාපති / தவிசாளர் / Chairman | 2696470 | ෆැක්ස් / தொலைநகல் / Fax | 2694924 |
| ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrc@sltnet.lk | | |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 -11- 2694925, 2685980, 2685981 | | |
| ලේකම් / செயலாளர் / Secretary | 2689558 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 2689064 |
| වෙබ් / இணையம் / Web | www.hrcsl.lk | | |

මේ අනුව කොමිෂන් සභාව විසින් මෙම මැතිවරණ වකවානුවේ නිදහස් හා සාධාරණ මැතිවරණයක් පවත්වාගෙන යාම වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන් තම වගකීම් නිසි ලෙස ඉටුකරන්නේ ද යන්න අවධානයට ලක්කර ඇත. එබැවින් පහත සඳහන් පරිදි ක්‍රියාකරන ලෙසට ඔබ ඇතුලු ඔබ පාලනය යටතේ පවතින ආයතනවල කාර්ය මණ්ඩලයන්ට දැනුම් දෙන ලෙස හා දැනුවත් කරන ලෙස මෙයින් දන්වා සිටිමු.

- නීතිය අපක්ෂපාතීව හා සාධාරණව ක්‍රියාත්මක කළ යුතු ය.

- නීතිය ක්‍රියාත්මක නොකර සිටීම ද මූලික අයිතිවාසිකම් කඩකිරීමක් වේ.

- නිල රාජකාරි ක්‍රියාත්මක නොකිරීම, අගතිගාමී බව, රාජකාරි නොකර හැරීම, අයුතු ලෙස ක්‍රියාත්මක කිරීම, බලය ඉක්මවා ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය දේපල හා සම්පත් යම් දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම් වෙනුවෙන් යොදවා ගැනීම හෝ යෙදීමට ඉඩ ලබාදීම හෝ තවත් කණ්ඩායමකට හානිකර ලෙස යොදා ගැනීම මූලික අයිතිවාසිකම් කඩවීමක් ලෙස එම නිලධාරීන් පුද්ගලික වගකීමට යටත් වේ.

- එසේම දේශපාලන අයිතිය නොමැති රාජ්‍ය නිලධාරීන් දේශපාලන කටයුතුවල යෙදීම ද දේශපාලන අයිතීන් පවතින රාජ්‍ය නිලධාරීන් තම රාජකාරි කාලය තුළ හෝ තම රාජකාරි නිල බලය යොදාගනිමින් දේශපාලනයේ යෙදීම ද මැතිවරණ නීතිය යටතේ සහ පරිපාලන නීතිය යටතේ ද වරදක් වන බව ද අවධානයට ලක්කර සිටිමු.

මෙම කරුණු අනුව ක්‍රියාත්මක කිරීමට ද මේ සම්බන්ධව ඔබ යටතේ පවතින අයතන සහ කාර්යය මණ්ඩල දැනුවත් කිරීමට ද ක්‍රියාකරන ලෙසට වැඩිදුරටත් දන්වා සිටිමු.

මෙම දැන්වීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව බව සළකන්න.

විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ප්‍රියන්ත ආර්. පී. පෙරේරා
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.